**ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

  මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

-----------------------------------------------------------

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට රු.64,099,072 ක් වූ අග්‍රිම ශේෂයට අක්මුදල් ගැලපීම් ගිණුමක් නිවැරදිව සකස් කර නොතිබුණි. | නිවැරදිව අක් මුදල් ගැලපුම් ගිණුමක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 ප්‍රකාරව අක් මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කර ඉදිරිපත් කර ඇත. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වැය විෂයයන් 6 කට අදාළව එකතුව රු.540,700,000 ක් වූ ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි 66 මඟින් රු.38,100,000 ක් මාරු කිරීමෙන් පසුවද රු.13,913,379 ඉතිරියක් සිදු වී තිබුණි. | නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් කළ යුතුය. | 2019 වර්ෂයේ අපේක්ෂිත වියදම නිවැරදි ලෙස ඇස්තමේන්තුගත කළද රජයේ ප්‍රතිපත්ති තීරණ ප්‍රකාරව හා භාණ්ඩාගාර චක්‍රලේඛන ප්‍රකාරව ප්‍රතිපාදන ඉතිරි වූ බවත් එම ප්‍රතිපාදන වැඩි කරන ලද රු.2,500.00 මාසික දීමනා ගෙවීමට හා අනෙකුත් අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා භාවිතාකළ බවත් දන්වා සිටිමි. |
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල 2(ii) උපලේඛනයේ සඳහන් වියදම් ශේෂයන් සහ ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි සඳහන් වටිනාකම් අතර වියදම් විෂයයන් 9 කට අදාළව රු.23,750,362 ක වෙනසක් පැවතුණි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුයි. | මේ පිළිබඳව භාණ්ඩාගාරයේ සීගාස් වැඩසටහනේ මෙහෙයුම් අංශයෙන් විමසා දැනුම් දීමට පියවරගත හැක. |

### (ආ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වෙනත් දෙපාර්තමේන්තු විසින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදුකළ වියදම්වල එකතුව රු.26,934,623 ක් වුවද අක්මුදල් ගැලපුම් ගිණුමේ රු.27,328,899 ක් ලෙස රු.394,276 ක් වැඩිපුර දක්වා තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුයි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හා 2019 දෙසැම්බර් 23 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව අක් මුදල් සැසඳුම් ගිණුම් පිළියෙල කරන ලද අතර එය ස්වයං ගැලපුම් ගිණුමක් බවත් ඒ අනුව වෙනසක් නොමැති බවත් දන්වා සිටිමි. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අත්තිකාරම් ගෙවීම රු.46,596,451 ක් වුවද එස්ජ් 52 භාණ්ඩාගාර වගුව අනුව වටිනාකම රු.41,891,725 ක් වූ බැවින් රු.4,704,726 ක වෙනසක් විය. | මුදලින් හා හරස් සටහන් වටිනාකම්ද ඇතුළුව එකතුව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවීම. | මූල්‍ය කාර්යය සාධන වාර්තාවේ ACA-5 ආකෘති පත්‍රයෙහි මුදලින් ගෙවන ලද අත්තිකාරම් බී ගිණුම් අගය රු.46,596,451.00 ක් වන අතර එකී මුදල මූල්‍ය කාර්යය සාධන වාර්තාවේ නිවැරදිව සටහන්කර ඇත. |
| **(ii)** | සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.144,130 ක ණය ශේෂය සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවුරුදු 02 කට වැඩි කාලයක් ගතවී ඇතත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාළ නිලධාරීන් විසින් අයකර ගැනීම් කඩිනම් කළ යුතුය. | තවදුරටත් මේ පිළිබඳව පරීක්ෂාකර බලා අයකර ගැනීමට පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. |

**(ඈ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | විගණනය වෙත ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව තැන්පතු ගිණුම්වලට අදාළ වසර තුළ මුළු බැර කිරීම්වල එකතුව රු.10,278,261 ක් සහ වසර තුළ මුළු හර කිරීම්වල එකතුව රු.15,455,559 ක් වුවද හරස් සටහන්වලින් සිදුකළ හර හා බැර ශේෂ නොසලකා මුදලින් සිදුකළ වටිනාකම් පමණක් සැලැකිල්ලට ගෙන එනම් බැරකිරීම් ලෙස රු.9,543,706 ක් සහ හර කිරීම් ලෙස රු.14,679,450 ක් ලෙස මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයට ගෙන තිබුණි. ඒ අනුව හර ශේෂය රු.776,109 ක් සහ බැර ශේෂය රු.734,554 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | හරස් සටහන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුවීම. | 2019 වර්ෂයේ දී තැන්පතු ගිණුමට හරස් සටහන් වලින් කරන ලද හර හා බැර වූ අගයන් ඇතුළත් කර නොමැතිබව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම හා එස්ඒ 30 ආකෘතිය අනුව තැන්පතු ගෙවීම් එකතුව රු.15,455,559 ක් වුවද වෙනසක් නොතිබියදී අක් මුදල් ගැලපුම් ගිණුමට ඉහත ශේෂ අතර වෙනස ලෙස රු.14,679,450 ක් මාරු කර තිබුණි. | හරස් සටහන් ඇතුළුව සටහන් කළ යුතුවීම. | මුදලින් ගෙවන ලද තැන්පතු පමණක් ගිණුම්ගත කර ඇති අතර හරස් සටහන් මඟින් ගෙවීම් ඇතුළත් කර නොමැති බව දන්වමි. |

## (ඉ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කරන ලද ඒසීඒ 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් අවසන් වටිනාකම් හා පරිගණක වගු අංක එස්ඒ 82 හි සඳහන් වත්කම් කේත 4 ට අදාළව රු.19,624,882 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාර මුද්‍රිතයන් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළයුතුයි. | ගොඩනැගිලි හා ඉදි කිරීම්වල රු.60,000.00 ක අගය සීගාස් වැඩසටහනෙහි වැරදීමකින් නොනිමි වැඩ (WIP) යටතේ ගිණුම්ගත වී ඇත. එය නිවැරදි කිරීමට කටයුතු සිදුකර ඇත.<br>2020 ජනවාරි ගිණුම් සාරාංශයෙන් නිවැරදි කර ඇත. |
| (ii) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ඒසීඒ 06 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් අවසන් වටිනාකම එස්ඒ 80 පරිගණක මුද්‍රිත මූල්‍ය නොවන වත්කම් සාරාංශයේ සඳහන් වටිනාකම් අතර වත්කම් කේත 3 කට අදාළව රු.3,533,810 ක වෙනසක් විය. | පරිගණක මුද්‍රිතයන් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුයි. | ඉහත (අ) පරිදි නිවැරදි කිරීම මඟින් වෙනස ඉවත්වන බව දන්වා සිටිමි. |
| (iii) | මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ඒසීඒ 06 ප්‍රකාශනයෙහි සඳහන් මිලදී ගැනීම් වටිනාකම හා එස්ඒ 82 පරිගණක මුද්‍රිත ප්‍රකාශනයෙහි ඇතුළත් වටිනාකම් අතර වත්කම් කේත 3 ට අදාළව රු.3,529,310 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාර මුද්‍රිතයන් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුයි. | ඉහත (අ) පරිදි නිවැරදි කිරීම මඟින් වෙනස ඉවත්වන බව දන්වා සිටිමි. |
| (iv) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි ආරම්භක ශේෂය හා පසුගිය වසරේ විගණන කරන ලද මූල්‍ය ප්‍රකාශනයෙහි අඩංගු අවසන් ශේෂය අතර වත්කම් කේත 6 කට අදාළව රු.1,132,014,116 ක වෙනසක් පැවතුණි. | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අවසන් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ඉදිරියට ගෙන ආ යුතුයි. | 2018 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයන් ශුන්‍යකර නැවත සීගාස් අගයන් ඇතුළත් කිරීම කරන ලද අතර ඒ අනුව මෙම වෙනස ඇතිවිය. |

| | | | |
|---|---|---|---|
| (v) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.1,089,762,966 ක් වුවද එස්ජ් 82 පරිගණක වගු අනුව එම වටිනාකම රු.1,086,169,166 ක් බැවින් රු.3,593,800 ක වෙනසක් විය. | පරිගණක මුද්‍රිත අනුව නිවැරදි අගයන් සටහන් කිරීමට කටයුතු කළ යුතුය. | 2019 දෙසැම්බර් මස මාසික ගිණුම් පියවීමෙන් පසු 2020 ජනවාරි ගිණුම් සාරාංශයෙන් නිවැරදි වී ඇත. |
| (vi) | මූල්‍ය ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ඒසීඒ - 06 ප්‍රකාශනයෙහි අනුව වර්ෂය තුළ මිලදී ගැනීම් වටිනාකම රු.11,372,877 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ 2(II) වියදම් ප්‍රකාශනයෙහි රු.12,792,257 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,419,380 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශ නිවැරදිව සකස් කළ යුතුය. | වර්ෂ අවසානයේ දී ප්‍රතිපාදන ශේෂයට හෝ අදාළ වැය ශීර්ෂයේ වියදම්වලට ඇතුළත් නොවීම නිසා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි වර්ෂය තුළ මිලදී ගැනීම් වටිනාකම රු.11,372,877 ක් ලෙස සටහන් වේ. |
| (vii) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දේපල පිරියත හා උපකරණ සංචිත වටිනාකම රු.1,089,762,966 ක් වුවද එස්ජ් 90 පරිගණක මුද්‍රිත වගු අනුව වටිනාකම රු.1,086,169,166 ක් වූ බැවින් රු.3,593,800 ක වෙනසක් විය. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. | 2019 දෙසැම්බර් මස මාසික ගිණුම් පියවීමෙන් පසු 2020 ජනවාරි ගිණුම් සාරාංශයෙන් නිවැරදි කර ඇත. |

**(ඊ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

**--------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ----------------------------- |
| දෙපාර්තමේන්තු පොත් අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමෙහි අත්තිකාරම් ලැබීම් රු.44,644,630 ක් වූ අතර එස්ජ් 52 භාණ්ඩාගාර වගුව අනුව ලැබීම රු.41,891,725 ක් විය. වෙනස වූ රු.2,752,905 ක් අක් මුදල් ගැලැපුම් ගිණුමට මාරුකිරීම වෙනුවට රු.46,596,451 ක් මාරු කර තිබුණි. | නිවැරදිව අක්මුදල් ගැලැපුම් ගිණුම සකස් කළයුතුය. | අත්තිකාරම් මුදලින් ගෙවීම් අක්මුදල් ගැලපුම් ගිණුමට මාරුකර ඇති බව දන්වා සිටිමි. |

**(ඌ) අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) මූලධන වියදම් වෙනුවෙන් ජනවාරි සිට අප්‍රේල් දක්වා වාර්ෂික අග්‍රිම සීමාව රු.199,600,000 ක් වුවද අක් මුදල් සීමාව පිළිබඳ සැලකිලිමත්වීමෙන් තොරව, රු.309,500,000 ක්ද මැයි සිට ජූනි දක්වා අග්‍රිම සීමාව රු.643,834,000 ක් වුවද රු.807,800,000 ක් ද ඉල්ලුම් කර තිබුණි. | අක්මුදල් අයදුම් පත්‍රය අනුව ඉල්ලීම් සිදුකළ යුතුය. | නැවත නැවත ඉල්ලීම් කිරීම තුළ මෙම ද්විගණනයන් සිදුවී ඇති බව කාරුණිකව දන්වමි. |
| (ii) උක්ත චක්‍රලේඛයේ 3 (ii) ඡේදය අනුව 2018 හෝ ඊට පෙර වර්ෂවලදී තුන්වන පාර්ශවයන්ගෙන් පොදු තැන්පතු ගිණුම් යටතේ රැස් කර ඇති මුදල් 2019 වර්ෂයේදී ගෙවිය යුතු අක්මුදල් අයදුම් පත්‍රයෙහි රු.4,000,000 ක් ලෙස දක්වා තිබුණද 2019 වර්ෂය තුළ ගෙවීම් ශේෂය රු.6,556,796 ක් විය. | අක්මුදල් අයදුම් පත්‍රය අනුව ඉල්ලීම් සිදුකළ යුතුය. | අදාළ ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී පැවති මූලාශ්‍ර අනුව ඇස්තමේන්තු සකස් කළ බව පෙන්වා දෙමි. |

**(ඌ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) වෘක්ෂලතා ලේඛනය/ ඵලදා ලේඛනය | | |
| 2015 අගෝස්තු 5 දිනැති අංක 2/2015 දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ දෙපාර්මේන්තු චක්‍රලේඛය. | වෘක්ෂලතා ලේඛනය / ඵලදා ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි | පිළිතුරු ලබාදී නැත. |

(ii) ඇප ලේඛනය
---------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | පිළිතුරු ලබාදී නැත |

(iii) බැරකම් පිළිබඳ ලේඛනය
----------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |

## (එ) විගණන සාක්ෂි නොවීම
--------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුව අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------ | ----------- | -------------------- |
| (i) | එකතුව රු.82,896,816 ක් වූ ගිණුම් විෂයකට හා හානි හා පාඩු සිද්ධි 2 කට අදාළව උප ලේඛන හා ලිපි ගොනු වැනි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සාක්ෂි ලබාදීමට කටයුතු කළ යුතුය. | විගණනය විසින් පෙන්වා දෙන කරුණු සඳහා අවශ්‍යා සාක්ෂි ලබාදිය හැක |
| (ii) | අපනයනාභිමුඛව මීපැණි නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද මීමැසි පාලන ව්‍යාපෘතිය කෑගල්ල, අනුරාධපුර, නුවරඑළිය දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කර තිබුණි. මීමැසි පෙට්ටි 632 ක්ද, දූමක 63 ක් හා නිස්සාරක 153 ක් ලබාදී තිබුණද මීමැසි ජනපද ගණන, මීපැණි ප්‍රමාණය, වැනි තොරතුරු නිවැරදිව පවත්වාගෙන නොතිබුණු බැවින් එම ව්‍යාපෘතියේ කාර්යසාධනය ඇගැයීමට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | ව්‍යාපෘතියේ තොරතුරු පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |

**(ඒ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (i) | 2003 අංක 22 දරන බීජ පනත | - | පුද්ගලික පැළ තවාන්කරුවන් විසින් ලියාපදිංචිය වාර්ෂිකව අළුත්කළ යුතු වුවද පුද්ගලික පැළ තවාන් 32 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | බීජ පනත යටතේ ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| (i) | VIII පරිච්ඡේදයේ iv වගන්තිය | 14,687,765 | අතිකාල වැඩ සඳහා මුදල් වැයකළ යුත්තේ අදාළ කටයුත්ත ඉටුකිරීමට අන් කිසිම මාර්ගයක් නැති අති විශේෂ අවස්ථාවල සහ සාමාන්‍ය වැඩවලින් ඒකාන්තයෙන් පරිබාහිර හා හදිසි වූද සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකි වැඩ සඳහා පමණක් වුවද සැලැසුම් කළ වාර්ෂික අයවැය ප්‍රතිපාදනයට මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්වල ප්‍රතිපාදන මාරු කර ගෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | දෙපාර්තමේන්තුවේ කාර්යභාර්යන් ඵලදායිව හා අපේක්ෂිත ලෙස සිදු කිරීම සඳහා අවශ්‍ය වූ අතිරේක ප්‍රතිපාදන මුදල වූ රු.2,200,000 ක මුදල මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන සලසා ගත් බව දන්වා සිටිමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | XIX පරිච්ඡේදයේ 4.3.3 වගන්තිය | - | ප්‍රධාන කාර්යාලයේ රජයේ නිවාස සම්බන්ධයෙන් ඉල්ලුම්පත්‍රයක්ම පොරොත්තු ලේඛනයක සටහන් කරමින් මධ්‍යගත තොරතුරු පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුය. | රජයේ නිවාසවල භාරකාරිත්වය අදාළ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂකවරුන් වෙත සහ පර්යේෂණ මධ්‍යස්ථාන භාර අධ්‍යක්ෂකවරුන් වෙත පවරා ඇති බැවින් බාහිරින් ද ලේඛනයක් නඩත්තු කරනු නොලබන බව දන්වා ඇත. |
| (iii) | XIX පරිච්ඡේදයේ 5.6 වගන්තිය | - | 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු නිවාස 89 න් නිවාස 60 ක් සඳහාම ආර්ථික කුලියක් අයකර ගෙන තිබුණු අතර කුලිය නිර්ණය කිරීම සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාද ලබාගෙන නොතිබුණු නිවාස 60 න් නිවාස 44 ක් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. |
| (iv) | XIX පරිච්ඡේදයේ 6.1.1 වගන්තිය | | යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියලුම නිවාසවල බදුකාලය වර්ෂ 05 ක් වුවද අවුරුදු 05 ඉක්මවූ නිලධාරීන්/සේවකයින් 33 ක් තව දුරටත් රජයේ නිවාසවල පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම් කාලය ඉක්මවූ නිලධාරීන්ගේ ගිවිසුම් යාවත්කාලීන කළයුතු බව දන්වා ඇත. |
| (v) | xxiv පරිච්ඡේදයේ 04 වන වගන්තිය | 899,725 | විවිධ හේතුන් මත සේවයේ නොයෙදෙන නිලධාරීන්/සේවකයින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදල් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන | | සේවයෙන් විශ්‍රාමගිය එහෙත් සේවයේ පිහිටුවීම හා විශ්‍රාම ගැන්වීම පිළිබඳව ඇති විෂයගත කරුණු මත විශ්‍රාම ප්‍රධානය ප්‍රමාද වීම මත අයකර ගැනීමට නොහැකි වී |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | විටත් අදාළ කටයුතු සිදුකර නොතිබුණි. | | ඇති අතර දැනට සේවය හැරගොස් ඇති වැඩ තහනම් වී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීම සඳහා නීති උපදෙස්මත කටයුතු කිරීමට නියමිතයි. |
| (ඇ) | අති විශේෂ ගැසට් පත්‍ර<br>---------------------- | | | | |
| | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්යය පරිපාටි රීති මාලාවේ xviii වැනි පරිච්ඡේදයේ රීති 193 ඡේදය | - | සෑම රජයේ නිලධාරියෙකුම ස්ථාන මාරුවීම්වලට යටත්විය යුතු වුවද මාතර දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් 28 දෙනෙකු අවුරුදු 05 සිට 25 දක්වා දීර්ඝකාලක් එකම සේවා ස්ථානයේ සේවය කර තිබුණි. | ස්ථානමාරු නියෝගවලට යටත්විය යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------- | | | | |
| (i) | මුදල් රෙගුලාසි 11 | 12,045,964 | ගමන් වියදම් වැඩිවීම සඳහා හේතු සම්පූර්ණයෙන් පැහැදිලි කළයුතු අතර එවැනි පැහැදිලි කිරීමක් හෝ ඉඩදීමක් නොමැතිව වියදම් දරා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන මු.රෙ.66 ප්‍රකාරව යොදාගත් බව දන්වා සිටිමි. |
| (ii) | මුදල් රෙගුලාසි 104(2) | - | වාහන අලාභහානි සම්බන්ධ විස්තර විගණකාධිපති වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 105, 109(1) හා 2014 මාර්තු 26 දිනැති අංක පීඑෆ්/ආර්ඊඩී/2014/ පොදු දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 11,725 | 2019 අප්‍රේල් 03 දින අනතුරට පත්වූ වාහන සම්බන්ධයෙන් අවසන් වාර්තාව 2020 පෙබරවාරි 18 දින වන විටත් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර රියදුරාගෙන් අයකර ගත යුතු අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | 2019 දෙසැම්බර් 12 දින මූලික විමර්ශන සඳහා නිලධාරීන් පත්කර ඇති බව දන්වා ඇත. |
| (v) | මුදල් රෙගුලාසි 187(3) | 289,762 | මුදල් භාරගැනීමේ කාර්යාලවලට ලැබෙන මුදල් පිළිබඳව දිනපතා හෝ හැකිතාක් අප්‍රමාදව බැංකු ගිණුමට යැවීමට කටයුතු කළයුතු යුතු වුවද මධ්‍යම පැළ තවාන් 04 ක දින 05 ත් දින 26 ක් ප්‍රමාද කර බැංකුගත කර තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | නිලධාරීන්ගේ ගමන් අවශ්‍යතාවය මත සිදුවී ඇති අතර ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දන්වා සිටිමි. |
| (vi) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | 319,693 | කිසියම් විශේෂිත කාර්යයන් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාදීමට ගණන්දීමේ නිලධාරියෙකුට හැකියාව පවතින බව දක්වා තිබුණද එම රෙගුලාසියට අනුකූල නොවී අවස්ථා 02 කදී අත්තිකාරම් ලබාදී තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි අනුව ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (vii) | මුදල් රෙගුලාසි 571(2) | 167,400 | වසර 02 ඉක්ම වූ තැන්පතු ශේෂ 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව රජයේ ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (viii) | මුදල් රෙගුලාසි 1646 | | වාහන ධාවන සටහන් අදාළ මාසය අවසන් වී දින 15 ක් ගතවීමට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් විගණකාධිපති වෙත එවිය යුතු වුවද නියැදි පරීක්ෂාව අනුව දෙපාර්තමේන්තුවට අයත් වාහන 07 ක ප්‍රමාද වී ධාවන සටහන් ඉදිරිපත් කර තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අඩුපාඩු සිදු නොවන ලෙසට උපදෙස් ලබාදී ඇති අතර සියළුම රියදුරන්ගේ අතිකාල, ගමන් වියදම් ගෙවීමේදී ධාවන සටහන් ඉදිරිපත් කරන තෙක් ගෙවීම් අත්හිටුවන බවද දන්වා ඇත. |
| (ඉ) | භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ<br>--------------------- | | | | |
| (i) | 2015 ජූනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 243/2015 2 ඡේදය | 405,422 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) වගන්තිය ප්‍රකාරව නියමිත කාර්යය සඳහා නීතියෙන් වෙන් කරනු නොලබන සියලුම ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව දක්වා තිබුණද ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට හෝ මුදල් ගෙවීමට හෝ කටයුතු නොකර තැන්පතු ගිණුමට බැර කර තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | අවශ්‍ය ලිපිලේඛන නොලැබීම හේතුවෙන් රඳවා ඇති බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 5.4 ඡේදය | 323,423 | තැන්පතු කාණ්ඩයකට අදාළ කරගත නොහැකි විටෙක නව තැන්පතු කාණ්ඩයක් හා අංකයක් ලබාගත හැකි වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | මීන් ඉදිරියට ආදායමට බැර කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | රජයේ වාහන සඳහා සෑම මාස 12 කින් පසු හෝ කි.මී.25000 දුර ධාවනය කිරීමෙන් පසු යෙදෙන අවස්ථාවේදී ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදු කළ යුතු වුවද 2019 වර්ෂයේදී වාහන සඳහා ඉන්ධන පරිභෝජන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු බව දන්වමි. | පිළිතුරු ලබාදී නැත |
| (iii) | 2015 ජුලි 14 දිනැති අංක 04/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | සියලුම රජයේ වාහන රක්ෂණය කළ යුතු වුවද නියදි පරීක්ෂණය අනුව සංචිත වාහන 11 ක් 2019 වර්ෂයේදී රක්ෂණය නොකර ධාවනයේ යොදවා තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම පැළ තවානට කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද රු.4,900,000 ක ප්‍රතිපාදන කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගෙන මාස 08 ක කාලයක් නිෂ්කාර්යයව රඳවාගෙන තිබුණි. | ප්‍රතිපාදන උපරිම අයුරින් ප්‍රයෝජනයට ගත යුතුය. | තම අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන ආයතනය විසින් නිවැරදි සැලැසුම් නිසි වේලාවට සකස් කර නොමැති බව හා ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවී සිදු කිරීමට සිදුවන නිසා 2019 සැප්තැම්බර් 11 දින වන විටත් ආරම්භ නොකළ බව දනවා ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් රටේ මහජනතාවට වන සේවයට සහ දායකත්වයට වඩා මෙම ආයතනය පවත්වාගෙන යාම සඳහා දරන ලද නඩත්තු පිරිවැය වැඩි මට්ටමක පැවතුණු බැවින් රු.මිලියන 563 ක මූලධන මුදල් හැසිරවීම සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු.මිලියන 658 ක් වියදම් දරා තිබුණි. | මූලධන වියදම්වලට සාපේක්ෂව පුනරාවර්තන වියදම් දැරීමට වගබලා ගත යුතුය | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රජයට හා මහජනතාවට අවශ්‍ය වූ ආර්ථික හා සමාජීය ප්‍රතිඵලය ළඟාකර දීමට කටයුතුකර ඇති බව දන්වා සිටිමි. |
| (ආ) | මුදල් රෙගුලාසි 04 අනුව පාර්ලිමේන්තුව මඟින් අනුමත කරනු ලබන අරමුදල්, එම මුදල් වර්ෂය ඇතුළත සාක්ෂාත් කර ගත හැකි වැඩසටහනට සීමා කරන බවට සහතික වීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම විය යුතු වුවද වැය විෂයයන් 21 ක රු. 257,222,586 ක හෙවත් සියයට 6 සිට සියයට 78 දක්වා ඉතිරියක් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි අනුව වියදම් කළමනාකරණය කළ යුතුය. | භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය අනුව කටයුතු කිරීම සහ භාණ්ඩාගාරයෙන් ලබාදෙන අග්‍රිම මුදල අනුව ප්‍රාග්ධන බැදීම් සඳහා දෙසැම්බර් මාසයේදී ගෙවීම් සිදුවූ බව පෙන්වා දෙමි. |
| (ඇ) | 2019 ජූනි 17 දිනැති අංක 04/2019 අයවැය චක්‍රලේඛයේ 02 ඡේදයේ ii පරිදි විදුලිය හා ජල වියදම් සියයට 05 ක ඉතිරියක් ඇති කිරීම අරමුණු කරගෙන ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වන වගකීම නිශ්චිත නිලධාරියෙකු වෙත පවරා ඒ පිළිබඳ මාසිකව සොයා බැලීමට කටයුතු කළ යුතු වුවද ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සියයට 5 ඉතිරිය පිළිබඳ සැළකිලිමත් නොවී රු. 6,252,619 ක් වියදම් දරා තිබුණි. | භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. | දෙපාර්තමේන්තු මුළු දිවයිනටම ආවරණය වන පරිදි ස්ථාපිත කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද මූලධන වියදම්වලින් සියයට 25 ක් ඉතිරිකළ යුතු බව උපදෙස් ලබාදී තිබුණද වැය විෂයයන් 11 කට අදාළව ඉතිරිකිරීම් ප්‍රතිශතය 0.6 සිට 9.2 දක්වා පරාසයක පැවතුණි. | -එම- | පිළිතුරු ලබාදී නැත |
| (ඉ) | 2019 ජූනි 17 දිනැති අංක 04/2019 අයවැය චක්‍රලේඛයේ 02 (iv) ඡේදය අනුව ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂයය යටතේ වන වියදම් හැකිතාක් දුරට අවම කරගත යුතු බව දක්වා තිබුණද එලෙස අවධානය යොමු නොකර රු.5,003,011 ක වියදම් දරා තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව කටයුතු කර ඇති බව දන්වා ඇත. |
| (ඊ) | 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 අයවැය චක්‍රලේඛය අනුව වැය විෂයයන් 02 කට අදාළව වියදම් කළමනාකරණය කිරීම හේතුවෙන් ඉතිරියක් ඇති වූ බව දක්වා තිබුණද චක්‍රලේඛය අනුව අවුරා තබන ලද ප්‍රතිපාදනය ගැලපීමෙන් පසුවද රු. 1,147,687 හෙවත් සියයට 05 සිට සියයට 21 දක්වා ඉතිරියක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව කටයුතු කර ඇති බව දන්වා ඇත. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94 ට අනුකූල නොවී බැඳීම් හා බැරකම් යටතේ 289-2-2-0-1202 වැය විෂයයට අදාළව ඉතිරිය ඉක්මවා රු.16,638 ක බැරකම් දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | මින් ඉදිරියට ප්‍රතිපාදන ඉක්මවා බැඳීම්වලට එළඹීමට කටයුතු නොකරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට සිගාස් වෙත ඇතුළත් කර තිබූ එහෙත් නොගෙවූ බිල් වටිනාකම රු.160,779,689 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.155,818,430 ක් ලෙස රු.4,961,259 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව බැඳීම් හා බැරකම් හඳුනාගත යුතුය. | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පෙර සිගාස් වැඩසටහනට ඇතුළත් කරන ලෙස උපදෙස් දුනිමි. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තත්කාර්යය අතුරු අග්‍රිම මුදල් නිශ්චිත කාර්යයක් සඳහා යොදවා ගත යුතු වුවද අවස්ථා 08 කදී ලබාගත් සම්පූර්ණ රු.224,750 ක අත්තිකාරම් මුදල උපයෝජනය නොකර දින 08 සිට දින 44 අතර කාලයක් අත රඳවාගෙන නැවත පියවා තිබුණි. | නිවැරදි ඇස්තමේන්තුවක් සහිතව අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ යුතුය. | යම් විශේෂිත කාර්යයක් සඳහා ලබාදෙන තත්ත්කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය නිමවූ විගස දින 14 ක් තුළ දී පියවන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ආ) | නිශ්චිත ඇස්තමේන්තුවක් සකස් නොකර අත්තිකාරම් මුදල් ලබාගැනීම හේතුවෙන් අවස්ථා 43 කදී ලබාදුන් එකතුව රු.1,528,840 ක තත්කාර්යය අතුරු අග්‍රිම හා සුළු මුදල් පියවීමේදී වැය නොවූ රු.435,908 ක් හෙවත් සියයට 05 සිට සියයට 76 දක්වා පරාසයක මුදල් ආපසු ගෙවා තිබුණි. | නිවැරදි ඇස්තමේන්තුවක් සහිතව අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ යුතුය. | යම් විශේෂිත අනපේක්ෂිත තත්ත්වයකදී අතුරු අග්‍රිම වියදම් නොවී ඉතුරු වූ අතර එවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ඇ) | නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා අවස්ථා 17 කදී ලබාදුන් එකතුව රු.578,280 ක් වූ තත්ත්කාර්යය අතුරු අග්‍රිම ලබාගැනීමේදී රු.147,286 ක් වැඩිපුර වියදම් කර පසුව ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කර අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ යුතුය. | ඇතැම් ප්‍රායෝගික තත්ත්වයන් යටතේ අපේක්ෂිත ඇස්තමේන්තු ද ඉක්මවා යන අවස්ථාවලදි අතිරික්තයන් ප්‍රතිපූර්ණය කළ බව දන්වා සිටිමි. |

## 2.5 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර පොත් අනුව හා දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පත් ශේෂය අතර රු.31,749 ක වෙනසක් පැවතුණි. | වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. | විගණනය විසින් පෙන්වා දෙන තැන්පත් ගිණුමේ වෙනස වර්ෂ ගණනාවක සිට පැවති අතර මෙම වෙනස හඳුනාගෙන නිවැරදි කළද නව සිගාස් වැඩසටහනෙහි එය නිවැරදි වී නොමැති බැවින් ඉදිරියේදී නිරවුල් කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 395(ඇ) අනුව බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළග මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කළ යුතු වුවත් මාස 08 ක බැංකු සැසඳුම් නියමිත දිනට පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | වර්තමානයේ නියමිත දිනයට බැංකු සැසඳුම් පිළියෙල කර ඇති බව දන්වා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 දැක්ම හා මෙහෙවර

---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ----------------- | ------------------------ |
| (අ) | අපනයන කෘෂිකර්ම දෙපාර්මේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරකමක් වන අපනයන කෘෂි සේවා නිපැයුම් හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම කළ යුතු වුවද අපනයන බෝග 11 කට අදාළව වර්ධනය සියයට 8900 සිට සියයට 0.4 දක්වා පරාසයක පැවතුණි. | ආනයනය පාලනය කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත. |
| (ආ) | 2017 ජූලි 25 දිනැති අංක 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා එම චක්‍රලේඛයට අදාළව නිකුත් කළ අතිරේක අනුව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරයේ නිමවුම පැහැදිලිව හඳුනා ගැනීමට හැකි වන පරිදි අවම වශයෙන් නිමවුම් දරශක 03 ක් ලේඛන ගත කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බව දන්වා ඇත. |
| (ඇ) | ආයතනය විසින් ඉටු කරන කාර්යයභාරයේ ප්‍රතිඵල හා සබැදි ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPI) අවම වශයෙන් 03 ක් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය | චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බව දන්වා ඇත. |

## 3.2 සැලැසුම් කිරීම

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ------------------- |
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 02(අ)ඡේදය අනුව රු.44,529,417 ක් වූ මූලධන වියදම් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ආ) | 2019 වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයෙහි සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ඇ) | 2019 නොවැම්බර් 26 දිනැති අංක එම්ආර්/එස්ජී/ආර්එස්පී/05/03 දරන ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ සැලැසුම්ගේ ලිපිය පරිදි අපනයන බෝග සංවර්ධනය සඳහා ගොවීන්ට සහාය වීම යන වැයවිස්තරය යටතේ (289-2-1-1-2202) රු.517,640,000 ක් වටිනාකමට රු.20,000,000 ක පරිපාලන වියදම් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ඈ) | පරිපාලන වියදම් ප්‍රතිපාදන රු.20,000,000 ක් වුවද සත්‍ය වියදම රු.21,320,000 ක් වූ බැවින් අනුමත සීමාව ඉක්මවා රු.1,320,000 ක වියදම් දරා තිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |
| (ඉ) | අපනයන කෘෂි බෝග පර්යේෂණ හා ඒකාබද්ධ රෝග හා පළිබෝධ කළමනාකරණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද කාර්යයන් 03 කට අදාළව ප්‍රතිපාදනය රු.8,000,000 ක් අතර රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රතිපාදන ඉතිරිකිරීමෙන් පසුවද ප්‍රගතිය සියයට 29 සිට සියයට 68 දක්වා අඩු මට්ටමක පැවතුණු හෙයින් අපේක්ෂිත ප්‍රතිලාභය ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සේවය සැපයීමේ කාර්යසාධන සහ ගුණාත්වය සහ ගුණාත්වය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ (කුරුඳු පිළිබඳ භූගෝලීය දර්ශක ස්ථාපනය) රු.16,500,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු කාර්යයන් 02 ක් ඉටු කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (උ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි පෙර වර්ෂයේ බිල්පත්වලට ගෙවීම් ලෙස රු.4,562,399 ක වටිනාකමක් ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතියට ඇතුළත්කර තිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |

### 3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නව වගා වැඩසටහන් යටතේ ලබාදෙන පැළ සඳහා සියයට 50 ක් වගා කරන්නන්ගෙන් අයකර ගත යුතු වුවද නව වගා වැඩසටහන යටතේ පැළ ක් නිකුත් කර තිබුණද එම පැළ සඳහා අයකිරීම් සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. | දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. | පිළිතුරු සපයා නොමැත. |
| (ආ) | නව වගා වැඩසටහනට යටතේ බෝග වර්ග 10 ක් වගා කිරීමට හඳුන්වා දී තිබුණද නියැදි පරීක්ෂාව ෙඅනුව මාතර හා අනුරාධපුර අපනයන කෘෂිකර්ම දිස්ත්‍රික් කාර්යාල බල ප්‍රදේශ තුළ කුරුඳු හා ගම්මිරිස් පමණක් වගා කර තිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |

## 3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------ |
| (අ) | මිශ්‍ර වගා ආදර්ශකයක් ලෙස 1978 වර්ෂයේ ආරම්භ කරන ලද මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය සතු වපසරිය අක්කර 12.5 ක් වූ අතර විදේශීය හා දේශීය සංචාරකයින් ඉලක්ක කර ගත් කුළුබඩු උද්‍යානයක් ලෙස මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම,කුළුබඩු ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා ප්‍රමිතින් හා මාර්ගෝපදේශ සැකසීම,කුළුබඩු ආශ්‍රිත ප්‍රජා පාදක කෘෂි සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවට හඳුන්වාදීම, ඒ සඳහා ගොවීන්, නිලධාරීන්, පාසල් ශිෂ්‍යයින් සහ විශ්ව විද්‍යාල සිසුන් පුහුණු කිරීම සහ කුළුබඩු බෝග පදනම් කර ගත් නිෂ්පාදන හඳුන්වා දීම සහ අලෙවිය යන අරමුණු කරා ළඟා වී නොතිබුණි. | ආයතනය සතුව පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීම පිණිස කුළුබඩු උද්‍යානයක් ලෙස සංවර්ධනය කළ යුතුය. | 2011 වර්ෂයේ සැලැසුම් සකස් කර ඉදිරිපත් කළද ප්‍රතිපාදන නොලැබීම මත අපේක්ෂිත ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ අතර ප්‍රතිපාදන වෙන් කර ගෙන ඉදිරියේදී සංවර්ධනය කර ඇති බව දන්වා ඇත. |
| (ආ) | මධ්‍යම පැළ තවානන් සතු භූමි ප්‍රමාණයෙහි අක්කර 1.94 ක් වූ අතර වගා කළ හැකි ඉලක්කය පැළ 155000 දක්වා වර්ධනය කළ හැකි වුවද 2019 වර්ෂය තුළ ඉලක්කය පැළ 104000 ක් ලබාදී පැළ 80488 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ වැටුප් වශයෙන් රු.3,524,112 ක්ද විදුලි වියදම් ලෙස රු. 22,466 ක් දරා තිබුණි. | වපසරිය අනුව බෝග නිෂ්පාදනය වර්ධනය කර ගත යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ඇ) | මධ්‍යම පැළ තවානක් සතු වපසරිය අක්කර 3 රූඩ් 3 පර්චස් 22 ක් වුවද බෝග වර්ග 6 ක් සඳහා පමණක් පැළ 215000 ක ඉලක්කයක් ලබාදී පසුව ඉලක්කයපැළ 208000 ක් ලෙස සංශෝධනය කළ පැළ 162676 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණු අතර රු.5,025,348 ක දළ වැටුපක් ගෙවා තිබුණි. | වපසරිය අනුව බෝග නිෂ්පාදනය වර්ධනය කර ගත යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ඈ) | | | |
| (i) | දිස්ත්‍රික්ක 17 ක් තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු පුවත් ප්‍රවර්ධන වැඩසටහන අම්පාර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වී නොතිබුණු අතර ඊට හේතු සාධක සොයා බලා වැඩසටහන ව්‍යාප්ත කිරීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ කටයුතු සිදුකළ නිෂ්පාදනය වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |

| | | | |
|---|---|---|---|
| (ii) | උක්ත වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 16 ක් හි මුළු ප්‍රගතිය සියයට 88 ක් වුවද දිස්ත්‍රික්ක 04 ක සපුරා නොගත් ඉලක්කය සියයට 38 සිට සියයට 60 දක්වා අඩු මට්ටමක පැවතුණි. | ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ඉ) | ධන සවිය වැඩසටහන යටතේ ආර්ථික ගෙවතු හා කුඩා ගෙවතුවල මුළු ප්‍රගතිය සියයට 16 ක් වුවද දිස්ත්‍රික්ක 03 කට අදාළව සපුරා නොගත් ඉලක්කය සියයට 10 සිට සියයට 85 දක්වා මට්ටමක පැවතුණි. | ඉලක්කය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ඊ) | ගෙවතු වගා සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 18 ක් තුළ කෝපි, කොකෝවා, වැනිලා, ඉඟුරු, කහ, කරාබු, සාදික්කා බෝග වගා කිරීම සඳහා පැළ නිකුත් කර නොතිබුණි. | නිෂ්පාදන පිළිබඳව පර්යේෂණ සිදුකර නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත |
| (උ) | | | |
| (i) | ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව, නුවරඑළිය යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කර නොතිබුණි. | සියලුම දිස්ත්‍රික්කවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ii) | ක්ෂුද්‍ර ජල සම්පාදනය මඟින් දේශගුණික බලපෑම් මැඩපවත්වා ගැනීම සඳහා වූ ඒකක පිහිටුවීමේ වැඩසටහන දිස්ත්‍රික්ක 07 ක් ක්‍රියාත්මක වී නොතිබුණු අතර වැඩසටහන ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක 04 ක ඒකක පිහිටුවීමේ ප්‍රගතිය සියයට 0 සිට සියයට 60 දක්වා පරාසයක් පැවතුණි. | සියලුම දිස්ත්‍රික්ක වල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (iii) | කෘෂි හා පළිබෝධ හානිය අවම කර ගැනීම වැඩසටහන ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක 03 ක ප්‍රගතිය සියයට 0 සිට සියයට 63 දක්වා පරාසයක පැවති අතර දිස්ත්‍රික්ක 07 ක වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | සියලුම දිස්ත්‍රික්කවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ඌ) | කාබනික ගම්මාන පිහිටුවීම<br>-------------------------------- | | |
| (i) | 2019 ජනවාරි 25 දිනැති අංක 03/2019/14 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව කාබනික ගම්මාන පිහිටුවීම මඟින් දේශීය හා විදේශීයව පවතින වෙළඳපල ඉල්ලුමට අනුව නියමිත ප්‍රමිතියෙන් යුත් සහතිකකරනය කරන ලද කාබනික අපනයන කෘෂිබෝග නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් කිරීමටත් එමඟින් ගොවි ආර්ථිකය නඟාසිටුවීමට අරමුණු කරගෙන තිබුණද වසර 10-15 කට වඩා වැඩි කාලයක සිට ගොවීන් රසායනික පොහොර නොයොදා වගාකරනු ලබන සාදික්කා, කුරුඳු, කෝපි, කරාබු, ගම්මිරිස් වගාවන් කාබනික වගාවන් ලෙස සළකා ගම්මාන 10 ක් වෙනුවෙන් රු.1,500,000 ක් වෙනුවෙන් වියදම් කර | කාබනික ගම්මාන පිහිටුවීමේ වැඩසටහන වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | යම් යම් ප්‍රමාණවලින් නිෂ්පාදන අලෙවි වී ඇත. පැවති දේශීය හා විදේශීය තත්ත්වයන් මත අනපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි වී ඇත.. |

| | | | |
|---|---|---|---|
| | ජාත්‍යාන්තර සහතිකකරණයක් ලබාදුන්නද එම ඵලදාව සඳහා ජාත්‍යන්තර වෙළඳපලක් නොලැබීමත් වෙළඳපලේ සාමාන්‍ය මිලටම නිෂ්පාදන අලෙවි වීමත් නිසා කාබනික ගම්මාන වෙනුවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දැරූ වියදම්හි ප්‍රතිඵලය බලාපොරොත්තු වූ මට්ටමට ළඟා වී නොතිබුණි. | | |
| (iii) | ධන සවිය වැඩසටහන යටතේ සෑම භෝගයක් සඳහාම ගෙවතු ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වුවද දිස්ත්‍රික් කාර්යාල 02 කට අදාළව කරාබු, වැනිලා, කහ, ගොරකා, පැඟිරි, කොකෝවා, සාදික්කා වැනි බෝග ආශ්‍රිතව ගෙවතු ස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ධනසවිය වැඩසටහන යටතේ සෑම බෝගයක් සඳහාම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |

## 3.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පෞද්ගලික ආයතනයක් මඟින් කාබනික ගම්මාන සහතිකරණ වැඩසටහන හරහා මහනුවර දිස්ත්‍රික්කයේ පොකුරු ගම්මාන 04 කට රු.791,805 ක් වැය කර කාබනික සහතිකකරණය ප්‍රමාද වී ලබාදී ඇති අතර සහතිකය නිකුත් කළ දිනය සහ සහතිකය වලංගු කාලය අතර පරතරය වසරකට වඩා අඩු බැවින් ගොවි සංවිධානයන්ට තම නිෂ්පාදන අලෙවි කර ගැනීමටත් ගෙවූ මුදලට සරිලන කාලය නිවැරදිව ලබාගැනීමටත් නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී කාබනික අපනයන සමාගම් කෙළින්ම ගම්මානවලට සම්බන්ධ කරනු ලැබේ. |
| (ආ) | ව්‍යාපෘති වාර්තාවේ 05 ඡේදය අනුව කාබනික ගම්මාන වැඩසටහනට අදාළව අළුත් ඉඩම් වගාකිරීමේ ඉලක්කය 2019 වසර අවසානයට හෙක්ටයාර් 200 ක් (අක්කර 500) වුවද ප්‍රගතිය ශුන්‍ය වූ අතර වගා කරන ලද ගොවීන් කාබනික වගාවන්ට යොමුවීමේ ඉලක්කය අක්කර 3750 ක් වුවද 2017 වර්ෂයේ දිස්ත්‍රික්ක 09 ක් යටතේ ඉඩම් අක්කර 537.5 ක් හා 2018 වර්ෂයේදී අක්කර 532.63 ක් පමණක් කාබනික වගාවට යොමු වී තිබුණද කාබනික වගාබෝග අපනයන කරුවන්ගේ විස්තර ඇතුළත් දත්ත පද්ධතියක් ද නිර්මාණය කර නොතිබුණි. | කාබනික වැඩසටහන යටතේ වගා ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. | මූල්‍ය සීමාවන් පැවතීම, ගම්මිරිස් මිළ පහත යාම වැනි කරුණු බලපා ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මධ්‍යම පැළ තවානක 2019 දෙසැම්බර් 31 දින වන විට සහතික නොකළ පැළ ප්‍රමාණය 25205ක් හා වූ අතර එම පැළ අධිවර්ධිත තත්ත්වයට පත්වීමට ආසන්න බැවින් එම පැළ සහතික කිරීම ප්‍රමාදවීම මත පැළයකින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ඈ) | 2019 ජනවාරි 25 දිනැති අංක 2019/1(1) දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 5 ඡේදය පරිදි ඉඟුරු සහ කහ කාබනික වගාවන් ලෙස පොකුරු ගම්මාන ක්‍රමයට (Cluster Village) වගා කිරීමට කටයුතු කළ යුතු වුවද. දිස්ත්‍රික් කාර්යාල 17 කින් සමාලෝචිත වර්ෂය තුළ එක් දිස්ත්‍රික්කයක පමණක් කහ හෙක්ටයාර් 26.78 ක්ද දිස්ත්‍රික් 02 ක ඉඟුරු හෙක්ටයාර් 6.32 ක්ද වැනි අඩු ප්‍රමාණයක් වගා කිරීමට කටයුතු කර තිබුණි. | කහ සහ ඉඟුරු බෝග වගා වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ඉ) | 2019 අප්‍රේල් 24 දිනැති අංක 3/5/36 දරන අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය පරිදි අපනයන ගම්මාන පිහිටුවීම මඟින් එක් අපනයන බෝගයකට ප්‍රමුඛතාවය දී අපනයන ගම්මාන ස්ථාපිත කළ යුතු වුවද මාතර, නුවරඑළිය, කුරුණෑගල දිස්ත්‍රික්කවල ගම්මිරිස්, කුරුඳු, පුවක්, කෝපි, සාදික්කා වැනි මිශ්‍ර බෝග වගා කිරීමට කටයුතු කිරීම මත එක් අපනයන බෝගයකට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය යන්න අරමුණ ඉටුවී නොතිබුණි. | එක් අපනයන කෘෂි බෝගයක් වගාකිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ඊ) | සහකාර දිස්ත්‍රික්ක කාර්යාල දෙකක් වෙනුවෙන් පැළ බෙදාදීම සඳහා වූ අක්කර 41 රූඩ් 01 පර්චස් 37 කින් යුත් මධ්‍යම පැළ තවානක් සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු සිදුකර දේශගුණික සාධක හඳුනාගෙන පැළ නිෂ්පාදන වර්ධනය කිරීමට කටයුතු කළ යුතු වුවද 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා බඳුන්ගතකළ ප්‍රමාණය සියයට 90 සිට සියයට 23 දක්වා අඩුවී තිබුණු අතර, පැළ නිෂ්පාදනයද 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සියයට 130 සිට සියයට 25 දක්වා අඩු වී පැවතුණි. | මධ්‍යම පැළ තවාන්වල පැළ නිෂ්පාදනය වර්ධනය කිරීමට කටයුතු කළයුතුය. | පැළ මඩු යොදා ගනිමින් පැළ නිෂ්පාදනය ක්‍රමිකව වැඩි කර ගැනීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (උ) | උක්ත මධ්‍යම පැළ තවාන 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සංවර්ධනය කිරීම සඳහා වූ රු 37,000,000ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණද 2020 වර්ෂය වන විටත් ඇස්තමේන්තුවේ සඳහන් අයිතම 03 ක් හැර ඉතිරි සංවර්ධන කටයුතු සිදු කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි. | සැළැස්ම අනුව සංවර්ධනය කර පැළ නිෂ්පාදන වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ළිඳ ඉදිකර ජල පොම්පයක් සවිකර ඇති අතර අඩි 60**x** **18** ප්‍රමාණයේ පැළ මඩු 07 ක් ඉදිකර ඇති අතර සන අඩි 4500 ක ගබඩා ඒකකයක් ඉදිකර ඇත. |
| (එ) | මධ්‍යම පැළ තවාන් තුළ පර්යේෂණ කටයුතු සිදුකර පැළ නිෂ්පාදනය වර්ධනය කර ගත යුතු වුවද ආයතනයේ මධ්‍යම පැළ තවානක පර්යේෂණ කටයුතු සඳහා අක්කර 03 ක් ලබාදී තිබුණද 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා භෝග වර්ග 02 කට අදාළව පමණක් පර්යේෂණ කටයුතු සිදු කර තිබුණි. | පර්යේෂණ සිදුකර නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | පර්යේෂණ පත්‍රිකා එළිදක්වා ඇති අතර පර්යේෂණ සිදු කිරීමට අදාළව වපසරිය වැඩි කිරීමට උපදෙස් ලබාදී ඇත. |
| (ඒ) | කාර්මික ප්‍රකාශන මඟින් තාක්ෂණික නව දැනුම ගොවි ප්‍රජාවට ලබාදිය යුතු වුවද මධ්‍යම පැළ තවාන් 04 කට අදාළව 2019 වර්ෂය වන විටත් කාර්මික ප්‍රකාශන 19 ක පමණ සෙමින් හා නිකුත් නොවන කාර්මික ප්‍රකාශන 1277 ක ශේෂයක් නිරීක්ෂණය වූ බැවින් වර්ෂ 03 කට අදාළව ප්‍රකාශන නිකුත් වන ප්‍රමාණයට සාපේක්ෂව කාර්මික ප්‍රකාශන තොග පවත්වාගෙන යාම හේතුවෙන් කාර්මික ප්‍රකාශන අලෙවි කිරීමට නොහැකි තත්ත්වයක් පැවතුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීමට කටයුතු කළයුතුය. | කාර්මික ප්‍රකාශන තොග ප්‍රසස්ත මට්ටමක තබාගන්නා ලෙස දන්වා ඇත. |

## 3.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.10,834,035 ක් වූ ව්‍යාපෘති 12ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | වර්ෂය තුළ සැලැසුම් කළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |

## 3.7 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 නොවැම්බර් 22 දිනැති අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව අපනයන කෘෂිබෝග දත්ත පද්ධතියක් සැකසීමේ මෘදුකාංගය නිමකර 2019 දෙසැම්බර් 24 දිනට පෙර දෙපාර්තමේන්තුවට භාරදෙන ලෙස මෘදුකාංග නිෂ්පාදන ආයතනය වෙත දැනුම් දී තිබුණද 2020 මැයි මාසය වන විටත් මෙම මෘදුකාංගය නිෂ්පාදනය කර නොතිබුණි. | කඩිනමින් කාර්යයන් සිදුකර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |

## 3.8 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සෙරපිස් පැළ තවානේ කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා රු.4,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2019 අප්‍රේල් මාසයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදි කිරීමට අදාළ සැළසුම් සකස් කිරීමට නිවැරදිව ප්‍රතිපාදිත මුදල දැනුම් නොදී භාරදී තිබුණ ද 2019 නොවැම්බර් 15 දින වන විටත් මෙම ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් තම ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන ඇස්තමේන්තු සකස් කළ යුතුය. | ප්‍රමාදවීම් සිදුවී ඇති අතර 05/2019 චක්‍රලේඛය අනුව ප්‍රතිපාදන අවුරා තැබීම මත ක්‍රියාත්මක නොකරන ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට දන්වා ඇත. |
| (ආ) | නව වගා වැඩසටහන සඳහා රුපියල් 142,110,000 ක ප්‍රතිපාදන ලබාදී රු.86,650,000 ක් වියදම් දරමින් දිස්ත්‍රික් 17 ක හෙක්ටයාර් 1312 ක වපසරිය සඳහා පැළ 8408440 ක් බෙදා දී තිබුණද නිවැරදි සැලැසුම් සකස් නොකිරීම හේතුවෙන් එම දිස්ත්‍රික්ක 17 හි සාදික්කා, කරාබු, කොකෝවා, කෝපි වැනි අපනයන බෝග වගා කිරීම සඳහා ඉලක්කයක් ලබාදී නොතිබුණි. | ඉලක්ක ලබාදී නිෂ්පාදනය වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |

## 3.9 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආයතනයට අදාළව පළමුවන දෙවන හා තෙවන නිමවුම් කාර්යසාධන දර්ශක හා ඒ අනුව අපේක්ෂිත නිමවුම් මට්ටමින් ලගාකර ගෙන ඇති නිමවුමේ ප්‍රතිශතය පැහැදිලිව දැක්වීම වෙනුවට කාර්යය සාධන දර්ශක ලෙස දර්ශක 08 ක් දක්වා තිබුණි. | කාර්යසාධන දර්ශක හා නිමවුම් පැහිදිලිව හදුනාගෙන දැක්වීමට කටයුතු කළ යුතුය. | කාර්යසාධන දර්ශක 08 ක් දක්වා තිබුණු අතර ඒ අනුව පළමුවැනි හා දෙවැනි කාර්යය සාධක දර්ශක සදහා නිමවුම් මට්ටම සියයට 94 ක් හා සියයට 100 ක් ලෙස දක්වා තිබුණි. |
| (ආ) | 2020 ජනවාරි 30 දිනැති අංක PED/RED/COPA/2019/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාවෙහි කෙටුම්පතක් ලබාදීමට කටයුතු කළ යුතුය. | පිළිතුර සපයා නැත. |

## 3.10 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.1 මාර්ගෝපදේශය අනුව ප්‍රදානය කරනු ලැබ ඇති කෙන්ත්‍රාත් සම්බන්ධයෙන් විස්තර වෙබ් අඩවියේ පළකළ යුතු වුවත් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රදානය කරනු ලැබූ කොන්ත්‍රාත් සම්බන්ධ විස්තර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 2.5.1 (අ) හා (ආ) මාර්ගෝපදේශයන් අනුව කටයුතු නොකිරීම මත ප්‍රසම්පාදන සැලැස්මෙහි රු.3,606,419 ක් වටිනාකමක් සහිත භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට සැලැසුම් කළද වර්ෂය තුළ මිලදී ගෙන නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 1.2(ඇ) මාර්ගෝපදේශය අනුව කඩිනමින් වැඩ ඉටු කිරීම හා භාණ්ඩ හා සේවා සැපයීම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අරමුණක් වුවද 2019 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කරන ලද රු.1,542,000 ක් වටිනා කොන්ත්‍රාත්තු 2019 වර්ෂය තුළ නිම නොකර 2020 වර්ෂය තෙක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2 මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව ඇතුළත් කරමින් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුනු අතර එක් එක් වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.3 මාර්ගෝපදේශය අනුව සියළුම ආශ්‍රිත වියදම් සැලැසුම් මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණද ප්‍රසම්පාදන තීරණයට අනුකූල නොවන පරිදි මිලදී ගැනීම් සිදු කර තිබුණු බැවින් රු.1,868,480 ක ප්‍රතිපාදන ඌන උපයෝජිතව පැවතුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2(ඇ) මාර්ගෝපදේශය අනුව කඩිනමින් වැඩ ඉටු කිරීම වැනි අරමුණු පිළිබඳව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහතික විය යුතු වුවද ඒ අනුව කටයුතු කිරීමට නොහැකිවීම මත 2019 වර්ෂයට අදාළව රු.1,000,000 ක ප්‍රතිපාදන (අත් පත්‍රිකා මුද්‍රණය) උපයෝජනය නොකර වර්ෂය තුළ අවුරා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |

| | | | |
|---|---|---|---|
| (උ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය අනුව වැඩ සඳහා අත්තිකාරම් ලෙස ගෙවිය හැකි උපරිම සීමාව කොන්ත්‍රාත් මුදලින් සියයට 30 ක් වුවද අපනයන කෘෂිබෝග දත්ත පද්ධතිය සැකසීමේ ටෙන්ඩරයට අදාළව කොන්ත්‍රාත් වටිනාකම රු.1,505,000 ක් (වැට් රහිත) වුවද ඉහත සීමාව නොසළකා රු.624,975 ක් හෙවත් සියයට 41 ක් අත්තිකාරම් ලෙස නිදහස් කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |
| (ඌ) | අත්තිකාරම් නිදහස් කිරීමක් සිදු කිරීමේදී පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත එම අත්තිකාරම නිදහස් කළ යුතු වුවද එවැනි සුරක්ෂණයක් ලබා නොගෙන රු.624,975 ක් නිදහස් කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළයුතුය. | පිළිතුරු සපයා නැත |

## 3.11 වත්කම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | -------------- |
| (අ) | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පවතින රජයේ නිවාස 89 න් රජයේ නිවාස 07 ක් භාවිතයට ගෙන නොතිබුණු අතර එම නිවාස වලින් නිවාස 06 ක් අබලන් තත්ත්වයේ පැවතීම හේතුවෙන් වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යයව පැවතුණි. | නිෂ්කාර්යය රජයේ නිවාස රජයට පාඩුවක් නොවන පරිදි රජයේ නිලධාරීන් පදිංචි කරීමට කටයුතු කළයුතු බව අවධාරණය කරමි. | කඩා ඉවත් කිරීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යොමු කිරීම, අළුත්වැඩියා කිරීමට ඇස්තමේන්තු ලබාගැනීමට යොමු කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු වාහන 86 න් වාහන 10 ක් වර්ෂය පුරාම ධාවනය කිරීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | එම වාහන පිළිබඳ සෙයා බලා සුදුස්සක් කිරීමට කටයුතු කළ යුතු බව අවධාරණය කරමි. | අළුත්වැඩියා සඳහා යොමු කිරීම, අළුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන නොමැතිවීම, රියදුරු පුරප්පාඩු නොමැතිවීම, අළුත්වැඩියා කටයුතු සිදුකිරීම ඵලදායි නොවීම වැනි කරුණු දක්වා ඇත. |
| (ඇ) | 2019 වර්ෂය තුළදී වාහන 19 ක් කි.මී.5000 ට අඩුවෙන් ධාවනය කර තිබුණි. | උපරිම ලෙස ධාවනය කරවීමට කටයුතු කිරීමට අවධාරණය කරමි. | රාජකාරි අවශ්‍යතා අනුව ධාවනයේ යොදවා ඇති බව දන්වා ඇත |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආයතනය සතු වාහන 11 ක හිමිකම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නමින් පවරා නොතිබුණි. | ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කළයුතු බව අවධාරණය කරමි. | 2020 ජනවාරි මාසයේදී එම වාහන පවරා ගැනීම සඳහා ඉල්ලුම් කර ලිපි යවා ඇතත් විගණන දිනය වන විටත් එම වාහනවල හිමිකම මාරු වී නොතිබුණි. |
| (ඉ) | දෙපාර්තමේන්තුවට අයත්, වෙනත් පාර්ශව විසින් භාවිතා කරනු ලබන අක්කර 442 ක් වූ ඉඩම් කැබලි 38 ක් විධිමත් ලෙස පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කළයුතු බව අවධාරණය කරමි. | පිළතුරු සපයා නැත |

**3.12 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2019 ජනවාරි 16 දිනැති එම්පීඅයි/02/05/06 දරන ලිපිය පරිදි ඇප තැබීම අනුමත කර ඇති නමුත් මුදල් රෙගුලාසි 880 අනුව විද්‍යාත්මක සේවයේ නිලධාරීන් 67 දෙනෙකු විසින් රු.670,000 ක් වටිනා ඇප තැබීමට කටයුතු කර නොතිබුණු අතර ද්විතියික මට්ටමේ නිලධාරීන් 142 දෙනෙකුගෙන්ද ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 96 දෙනෙකුගෙන්ද ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතු බව අවධාරණය කරමි. | පිළිතුරු සපයා නොමැත. |

**3.13 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසර 05 ත් වසර 10 ත් අතර රු.2,400,000 ක් වටිනා සිද්ධි 01 ක් සහ වසර 05 ට අඩු රු.1,579,413 ක් වටිනා සිද්ධි 04 ක් වශයෙන් එකතුව රු.4,079,413 ක් වටිනා සිද්ධි 05 ක් 2020 මැයි මාසය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අලාභ අයකර ගැනීමට කටයුතු කළයුතුය. | රු.2,400,000 ක අලාභයෙන් රු.225,000 ක් අයකර ඇති අතර අනෙකුත් සිද්ධි සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 01/2016(1) ජාතික අයවැය චක්‍රලේඛය අනුව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාගැනීමේදී අධ්‍යක්ෂවරු හා ඊට සමානමට්ටමේ නිලධාරීන් සඳහා ලබාගන්නා වාහනයක උපරිම මාසික බදු කුලිය (වැට් රහිත) රු.135,000 ක් විය යුතු වුවද අපනයන කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු අධ්‍යක්ෂවරු 08 දෙනෙකු සඳහා අනුයුක්ත කර තිබුණු වාහනවලට වැට් රහිත මාසික කුලිය රු.163,500 ක් ගෙවීම නිසා වසරකට මෙම වාහන 08 වෙනුවෙන් රු.2,736,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කර වැඩිපුර ගෙවනු ලබන මුදල අදාළ තීරණය ගනු ලැබූ නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. | වාහන හිමි නිලධාරීන් වෙතද හා වාහන 02 ක් සංචිත වාහන ලෙස යොදවා ඇති අතර විගණන විමසුම අනුව ඉදිරියේදී සංශෝධනයන් සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) | මධ්‍යම පැළ තවාන්වල උපයෝජනය කරනු ලබන බඳුන් මාධ්‍ය භෞතික පරීක්ෂාවේදී රු.240,046 ක ඌනතාවයක් පැවතුණි. | ඌනතාවයක් ඇති නොවන පරිදි නිවැරදිව නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |
| (ඈ) | 2017 වර්ෂයේ ඇති කරගත් ගිවිසුමේ 03(ඒ)වගන්තිය අනුව කිලෝමීටර් 3000 ක් මාසිකව උපරිමය වශයෙන් ධාවනය සඳහා යෙදවිය හැකි වුවද මාස 33 ක කාලයක් වෙනුවෙන් ඌන උපයෝජිත කිලෝමීටර් 191731 හි වටිනාකම රු.17,685,189 ක් විය. | ගිවිසුම අනුව කටයුතු කළයුතුය. | වාහන භාවිතා කරන නිලධාරීන් වෙත පැවරුණු රාජකාරිය අනුව අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා මාසිකව යොදවා ඇති අතර කිලෝ මීටර් 3000 ක් ධාවනය කළේ නම් රියදුරු සමඟ ගමන් වියදම් සහ අතිකාල වෙනුවෙන් අමතර වැයක් දැරීමට සිදුවන බව දන්වා ඇත. |

**3.14 අනාර්ථික ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | --------------------- |
| (අ) | බඳුන් මාධ්‍ය මිලදි ගැනීමේදී අවශ්‍යතාවය හඳුනා ගෙන මිලදී ගැනීම් සිදුකර නොමැති බැවින් මධ්‍යම පැළ තවාන් දෙකකට අදාළව ප්‍රමාණ 03 ක පොලිතින් බෑග් 2019 වර්ෂය ආරම්භයේදී ඒකක 746440 ක් පැවති අතර වර්ෂය තුළ පරිභෝජනයෙන් පසු වර්ෂය අවසානයට ශේෂය ඒකක 685657 ක් හෙවත් සියයට 92 ක් පැවතුණි. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |

| | | |
|---|---|---|
| (ආ) | බඳුන් මාධ්‍ය මිලදී ගැනීමේදී අවශ්‍යතාවය නිවැරදි ලෙස හඳුනාගෙන මිලදී ගැනීමට කටයුතු නොකිරීම මත මධ්‍යම පැළ තවානට අදාළව පොලිතීන් බෑග් වර්ග දෙකක 2016 වර්ෂයේ ආරම්භක ශේෂය ඒකක 63,435 ක ප්‍රමාණයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විටත් තවදුරටත් ඒකක 43135 ක් හෙවත් සියයට 68 ක් ඉතිරි වී තිබුණි. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත |

(

## 3.15 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතුව වාහන 86 ක් පැවතියදී සහ කුලී පදනම මත ලබාගත් වාහන 10 ක අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ස්ථාන සඳහා සුදුසු වාහන අනුයුක්ත නොකිරීම හේතුවෙන් ආයතනය විසින් වැයකරන ලද රු.61,933,458 ක වියදම නිසි කළමනාකරණයක් හා තීරණ ගැනීමක් සිදු නොවීම හේතුවෙන් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | ආයතනය සතු වාහන පිළිබඳව මනා සැළැස්මක් ඇති කර ගත යුතුය. | ආයතන සඳහා සංචිත වාහන යොදවා ඇති අතර ආයතනයට උපරිම වාසියක් ලබාගැනීමේ අරමුණින් පසුව සංශෝධනයන් සිදුකර ඇත. |
| (ආ) | මධ්‍යම පැළ තවානක සතු රබර් ගස් බදු දීමේ ක්‍රියාවලිය කඩිනම් ලෙස ක්‍රියාත්මක නොවීම මත 2017 වර්ෂය තුළ රු. 217,875 ක ආදායමද 2018 වර්ෂයේදී බදු දීමට මිල ගණන් කැඳවා නොතිබුණු බැවින් එම වර්ෂයේ ආදායමද ආයතනයට අහිමි වී තිබුණි. | වාර්ෂිකව බදු දීමට කටයුතු කර ආදායම් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | බදු දීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 මැයි 01 දිනැති අංක 03/2017 දරන අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ (iv) හි 03 ඡේදය පරිදි ලියාපදිංචි පුද්ගලික පැළ තවාන් ඉදිකිරීම වෙනුවෙන් තවාන් කරුවන් 08 දෙනෙකු වෙත රු.1,080,000 ක ලබාදෙන ආධාර මුදලින් සියයට 50 ක් වාරික දෙකකින් අයකර ගත යුතු වුවද රු.348,500 ක මුදලක් 2020 ජනවාරි මාසය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රෙල්ඛය අනුව ආධාර මුදලින් සියයට 50 ක වටිනාකම වාරික දෙකකින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නොමැත |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

---------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ------------------------ | --------- | --------------------------- |
| (අ) | දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සංදිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර තිබුණද ඒ අනුව ඉලක්ක හා දර්ශක හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දර්ශක හඳුනාගෙන ඒ අනුව ක්‍රියාත්මක විය යුතුය. | අරමුණු හඳුනාගෙන ඇති අතර ඊට අදාළව පාදක දත්ත්ත හා දර්ශක සකසමින් පවතී. |
| (ආ) | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගත හැකි වුවද, ආයතනය විසින් ඔවුන් හඳුනා ගෙන තිබුණද ආයතනයට අදාළ ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය නොවුණි. | ඉලක්ක හඳුනා ගෙන ක්‍රියාකාරී වීමට කටයුතු කළ යුතුය. | පාර්ශවයන් හඳුනාගෙන ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධන දත්ත පදනමක් පැවැතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දත්ත්ත පදනමක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත |
| (ඈ) | 2018 අප්‍රේල් 27 දිනැති අංක /08/65 දරන තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපාය මාර්ගික කළමනාකරණ සැලැස්මකට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමින් ළඟා කරගැනීම සඳහා සම්බන්ධිකරණ කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කර තිරසර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශය වෙතයොමු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බව දන්වා ඇත. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2019 වර්ෂය වෙනුවෙන් රු.48,129,000 ක් ප්‍රසම්පාදන වෙනුවෙන් සැලැසුම් කර තිබුණු අතර සත්‍ය වශයෙන් රු.42,731,936 ක් වැය කර තිබුණද ප්‍රසම්පාදන විගණනය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු අතර වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් විගණන විමසුම් 02 ක් පමණක් නිකුත් කර තිබුණි. | ප්‍රසම්පාදන විගණනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | සුළු ප්‍රසම්පාදන කටයුතු 05 ක් සහ ප්‍රධාන කාර්යාලයට අදාළව ප්‍රසම්පාදන කටයුතු 02 ක් සිදුකර ඇත. |

### 5.2 පුරවැසි /සේවාලාභි ප්‍රඥප්තිය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008දරන චක්‍රලේඛයේ හඳුන්වාදී ඇති පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව ආයතන විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍ර ලේඛය අනුව කටයුතු කළයුතු බව අවධාරණය කරමි. | චක්‍ර ලේඛය අනුව කටයුතු කර නොමැති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උක්ත චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභි ප්‍රඥාප්ති පිළියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගැයීම සඳහා ආයතන විසින් ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බව දන්වා ඇත. |

## 5.3 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් සඳහා යෝජිත පොදු කාර්යය සඳහා ඇමුණුම 02 හි දක්වා පහත නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>- වාර්ෂික විගණන සැලැස්ම පූර්ව විමසුමට භාජනය කර අනුමත කිරීම<br>- අයවැය සමාලෝචන වාර්තා ඇතුළු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම හා විෂමතා යලි ඇතිවීම වැළැක්වීමට පියවර ගැනීම<br>- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, කාර්යසාධන වාර්තා විමර්ශනය කිරීම<br>- භාණ්ඩාගාර චක්‍රලේඛ හා වෙනත් නියෝග පිළිබඳ දැනුවත් කිරීම, ව්‍යවස්ථාපිත හා වෙනත් නීති රීති පිළිපැදීමේ අවශ්‍යතාව පෙන්වාදීම<br>- සියළුම මානව හා අනෙකුත් සම්පත් පරිපාලනය හා සංවර්ධනය කිරීමේ කටයුතු සමාලෝචනය කිරීම හා තීරණ ගැනීම සඳහා වාර්තා ඉදිරිපත් කිරීම<br>- කාර්යය මණ්ඩල විනයට අදාළ කරුණු සමාලෝචනය කිරීම, නාස්තිය හා දූෂනය පිටු දැකීම හා ආයතනයේ වියදම් අරපිරිමැස්ම කෙරෙහි යොමු කරවීම. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව දන්වා ඇත. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

| සේවා වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 67 | 18 |
| තෘතීය මට්ටම | 29 | 17 | 12 |
| ද්විතියන මට්ටම | 800 | 628 | 78 |
| ප්‍රාථමික මට්ටම | 353 | 275 | 70 |
| | 1267 | 987 | 280 |

* 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවකයින් 115 ක් උක්ත සේවක මණ්ඩලයට අමතරව මුරකරු හා කම්කරු තනතුරේ ස්ථිර කර තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළයුතුය. | චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බව දන්වා ඇත. |
| (ආ) | කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ සහතික කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුර පිළිගත නොහැක. |
| (ඇ) | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුර පිළිගත නොහැක |
| (ඈ) | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | පිළිතුර පිළිගත නොහැක |

(ඉ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් නිකුත් කරන 2017 සැප්තැම්බර් 26 දිනැති පත්වීම් ලිපි අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ iii තනතුර යටතේ සේවා ස්ථාන තුනකට අනුයුක්ත කළ නිලධාරීන් තිදෙනෙකු ආයතන සංග්‍රහයේ v පරිච්ඡේදයේ 1.2 අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා නොගෙන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතියට යටත්ව ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි.

චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු බව අවධාරණය කරන අතර වැටුප් ප්‍රතිපූර්ණය කර ගත යුතු බව දන්වා සිටිමි.

පිළිතුරු සපයා නැත.

(ඊ) දෙපාර්තමේන්තු කාර්යයන් වෙනුවෙන් ඔවුන්ගේ දායකත්වය අවම මට්ටමක පැවතියදී 2018 ජනවාරි මාසයේ සිට 2019 වර්ෂයේ දෙසැම්බර් දක්වා එම නිලධාරීන් තිදෙනා වෙනුවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වැටුප් සහ දීමනා ලෙස රු.4,370,538.84 ක මුදලක් ගෙවා තිබුණද අමාත්‍යාංශය මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුයි.

පිළිතුරු සපයා නැත

(උ) පසුගිය වසර 05 ක කාර්යය මණ්ඩල සම්බන්ධයෙන් පැවති පුරප්පාඩු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
| ජ්‍යෙෂ්ඨ | 18 | 15 | 17 | 37 | 36 |
| තෘතියික | 12 | 23 | 23 | 22 | 20 |
| ද්විතියක | 172 | 168 | 153 | 195 | 185 |
| ප්‍රාථමික | 78 | 69 | 78 | 72 | 57 |

2015 සිට 2019 දක්වා පුරප්පාඩු පිළිබඳ සැසඳීමේදී ජ්‍යෙෂ්ඨ සහ තෘතියික මට්ටම්වල පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර තිබුණද ද්විතියක සහ ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම පුරප්පාඩු සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගොස් තිබුණි.

පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.

පිළිතුරු සපයා නැත